ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01. ශ්‍රී ලංකාව
දුරකථන අංක : 2477424, 2477423, 2477418
ෆැක්ස් : 2346257, 2477739
ඊ-මේල් : dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
| දිනය | 2019 අප්‍රේල් මස 17 දින |

## විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය - 2019 ජනවාරි

### සමස්ත නිරීක්ෂණ

- 2019 ජනවාරි මාසයේ වෙළඳ හිඟයෙහි පසුගිය මාසවලදී පිළිබිඹු කළ යහපත් ප්‍රවණතාව අඛණ්ඩව පැවතිණි. වෙළඳ හිඟය 2018 වසරේ දෙසැම්බර් මාසයේදී වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 701 සහ 2018 වසරේ ජනවාරි මාසයේදී වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 1,049 සමඟ සැසදීමේදී 2019 වසරේ ජනවාරි මාසයේදී එ.ජ. ඩොලර් මිලියන 617 ක් වාර්තා කළේය.
- වෙළඳ හිඟය සැලකිය යුතු ලෙස අඩු වීම, අපනයන ආදායම ඉහළ යෑමේ සහ ආනයන වියදම කැපී පෙනන ලෙස පහළ යෑමේ ඒකාබද්ධ ප්‍රතිඵලයක් විය. 2019 වසරේ ජනවාරි මාසයේදී අපනයන පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 7.5 කින් වර්ධනය වූ අතර, ආනයන සියයට 17.8 කින් සැලකිය යුතු ලෙස අඩු විය.
- සංචාරක පැමිණීම් 2019 වසරේ ජනවාරි මාසයේදී පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 2.2 කින් වර්ධනය වූ අතර, එමගින්, මාසය තුළදී සංචාරක ඉපැයීම් එ.ජ. ඩොලර් මිලියන 458 ක් ලෙස වාර්තා විය.
- 2019 වසරේ ජනවාරි මාසයේදී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ 2018 වසරේ ජනවාරි මාසය සමඟ සැසදීමේදී එ.ජ. ඩොලර් මිලියන 545 ක් දක්වා සැලකිය යුතු අඩුවීමක් වාර්තා කළේය.
- මූල්‍ය ගිණුමෙහි, රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙන් ශුද්ධ ගලායෑම් 2018 වසරේ දෙවන භාගය සමඟ සැසදීමේදී 2019 වසරේ ජනවාරි මාසයේදී පහළ මට්ටමක පැවතුණි.
- මේ අතර, 2019 වසරේ ජනවාරි මාසයේදී කල් පිරුණු එ.ජ. ඩොලර් බිලියන 1 ක ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරය රජය විසින් නියමිත පරිදි පියවන ලදී.

- 2018 වසරේ අවසානයේදී දක්නට ලැබුණු විනිමය අනුපාතිකය මත වූ දැඩි පීඩනය සැලකිය යුතු ලෙස වෙනස් වෙමින් 2019 වසරේ ජනවාරි මාසයේදී අඩු විය. ඒ අනුව, එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල 2018 වසරේ දෙසැම්බර් අවසානයේදී වාර්තා වූ රුපියල් 182.75 සිට 2019 වසරේ ජනවාරි මාසය අවසානයේදී රුපියල් 179.88 දක්වා සියයට 1.6 කින් අතිප්‍රමාණය විය. 2019 වසරේ අප්‍රේල් 17 දක්වා කාලපරිච්ඡේදය තුළ විනිමය අනුපාතිකය අතිප්‍රමාණය වෙමින් එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියල් 174.65 දක්වා සියයට 4.6 කින් අතිප්‍රමාණය විය.
- ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සඳහා ගෙවීම් සිදු කිරීමත් සමඟ, 2019 වසරේ ජනවාරි මස අවසානයේදී රටේ දළ නිල සංචිත එ.ජ. ඩොලර් බිලියන 6.2 ක් දක්වා පහළ ගියේය. ඉන්පසු, 2019 වසරේ මාර්තු මාසයේදී ශ්‍රී ලංකාව එ.ජ. ඩොලර් බිලියන 2.4 ක් වූ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සාර්ථකව නිකුත් කිරීම හේතුවෙන් 2019 වසරේ මාර්තු මස අවසානයේදී දළ නිල සංචිත එ.ජ. ඩොලර් බිලියන 7.6 දක්වා ඉහළ ගිය අතර, එය ආනයනික මාස 4.3 කට සමාන බව ඇස්තමේන්තු කර ඇත.

**සංඛ්‍යා සටහන 1: විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශය (අ)**

| කාණ්ඩය | 2018 (එ.ජ. ඩො. මිලියන) | වෙනස 2018/17 (%) | 2018 ජන. (එ.ජ. ඩො. මිලියන) | 2019 ජන. (එ.ජ. ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|
| අපනයන | 11,890 | 4.7 | 965 | 1,038 | 7.5 |
| ආනයන | 22,233 | 6.0 | 2,014 | 1,655 | -17.8 |
| වෙළඳ ශේෂය (ශුද්ධ) | -10,343 | | -1,049 | -617 | |
| සංචාරක ඉපැයීම් | 4,381 (ආ) | 11.6 | 448 (ආ) | 458 | 2.2 |
| විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ | 7,015 | -2.1 | 729 | 545 | -25.2 |
| කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ලැබීම් (ශුද්ධ) (ඇ) | -55 | | 37 | -14 | |
| රාජ්‍ය අංශයේ ලැබීම් (දළ) | 5,535 | | 293 | 281 | |
| භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර | 706 | | 170 | 72 | |
| දිගුකාලීන ණය | 1,329 | | 123 | 209 | |
| ඒකාබද්ධ ණය පහසුකම් | 1,000 | | - | - | |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර | 2,500 | | - | - | |
| ජා.මූ. අරමුදල - විස්තීර්ණ ණය පහසුකම | 252 | | - | - | |
| විදේශීය සෘජු ආයෝජන (ඈ) | 2,136 | | | | |
| සමස්ත ශේෂය | -1,103 | | -6 | -990 | |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, කොළඹ කොටස් වෙළඳපොළ, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

(අ) තාවකාලික

(ආ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2018 වර්ෂය සඳහා සිදු කළ සමීක්ෂණයට අනුව ඇස්තමේන්තු කළ සංචාරකයකු මෙරට ගත කරන සාමාන්‍ය කාලය සහ සංචාරකයකුගේ සාමාන්‍ය දෛනික වියදමට අනුව සංශෝධිතය

(ඇ) ද්විතීයික සහ ප්‍රාථමික වෙළඳපොළ ගනුදෙනු ඇතුළත් වේ

(ඈ) දත්තවල, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් වාර්තා කළ පරිදි සෘජු ආයෝජන සමාගම් වෙත වූ විදේශීය ණය සහ කොටස් වෙළඳපොළ වෙත වූ ශුද්ධ සෘජු ආයෝජන ඇතුළත් වේ

## වෙළඳ ශේෂය සහ වෙළඳ මිල අනුපාතය

- අපනයන ආදායම ඉහළ යෑම සහ ප්‍රධාන වශයෙන් රථවාහන හා අත්‍යවශ්‍ය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයනය අධෛර්යවත් කිරීම සඳහා ගනු ලැබූ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගවල බලපෑම පිළිබිඹු කරමින් ආනයන වියදම කැපී පෙනෙන ලෙස පහත වැටීම හේතුවෙන් 2019 ජනවාරි මාසයේදී වෙළඳ ගිණුමේ හිඟය 2018 ජනවාරි මාසයට සාපේක්ෂව කැපී පෙනෙන ලෙස අඩු විය.
- ආනයන මිල ගණන් පහළ යෑමේ වේගයට වඩා වැඩි වේගයකින් අපනයන මිල ගණන් පහළ යෑම හේතුවෙන් 2019 ජනවාරි මාසයේදී වෙළඳ මිල අනුපාතය පෙර වසරේ ජනවාරි මාසයට සාපේක්ෂව දර්ශකාංක 107.8 දක්වා සියයට 1.7 කින් පිරිහීමට ලක් විය. කෘෂිකාර්මික සහ කාර්මික අපනයන මිල ගණන් පහළ යෑම සමස්ත අපනයන මිල දර්ශකය පහළ යෑමට දායක වූ අතර, අන්තර් භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ මිල ගණන් පහළ යෑම ආනයන මිල දර්ශකය පහළ යෑමට දායක විය. කෙසේ වුවද, පසුගිය මාසයට සාපේක්ෂව 2019 ජනවාරි මාසයේදී වෙළඳ මිල අනුපාතය වර්ධනය විය.

**රූප සටහන 1: මාසික වෙළඳ ක්‍රියාකාරිත්වය (2018-2019)**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 2: වෙළඳ මිල අනුපාතය (2018-2019)**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ අපනයන ක්‍රියාකාරිත්වය

- 2019 ජනවාරි මාසයේදී වෙළඳ භාණ්ඩ අපනයන ආදායම අඛණ්ඩව දෙවැනි මාසයටත් එ.ජ. ඩොලර් බිලියනය ඉක්මවිය. ජනවාරි මාසය සඳහා සාපේක්ෂව අඩු අපනයන ආදායම් අගයක් වාර්තා වීමේ ප්‍රවණතාව සැලකූ විට 2019 ජනවාරි මාසයේදී අපනයන ආදායම එ.ජ. ඩොලර් බිලියනය ඉක්මවීම ප්‍රශංසනීය වේ. මේ අනුව, 2019 ජනවාරි මාසයේදී වෙළඳ භාණ්ඩ අපනයන ආදායම සියලුම ප්‍රධාන උපකාණ්ඩවල අපනයන ඉහළ යෑම හේතුවෙන් පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 1,038 ක් දක්වා සියයට 7.5 කින් වර්ධනය විය.
- 2019 ජනවාරි මාසයේදී අපනයන ආදායම ඉහළ යෑම සඳහා ප්‍රධාන වශයෙන් කාර්මික අපනයන දායක වූ අතර, ඒ සඳහා රෙදිපිළි හා ඇඟලුම්, රබර් නිෂ්පාදිත, යන්ත්‍රසූත්‍ර හා

යාන්ත්‍රික උපකරණ සහ ආහාර, පාන වර්ග හා දුම්කොළ අපනයන ඉහළ යෑම ප්‍රධාන වශයෙන් හේතු විය. යුරෝපා සංගමය සහ ඇමෙරිකා එක්සත් ජනපදය මෙන්ම ඉන්දියාව, ජපානය, ඕස්ට්‍රේලියාව, චීනය සහ කැනඩාව වැනි සාම්ප්‍රදායික නොවන වෙළඳපොළ වෙතින් ඇඟලුම් සඳහා වූ ඉහළ ඉල්ලුම හේතුවෙන් රෙදිපිළි හා ඇඟලුම් අපනයන ආදායම ඉහළ ගියේය. තවද, රබර් නිෂ්පාදිත යටතේ වර්ග කර ඇති සියලුම කාණ්ඩවල ඉහළ ක්‍රියාකාරිත්වය හේතුවෙන් මෙම මාසය තුළදී රබර් නිෂ්පාදිත අපනයන ආදායම ඉහළ ගියේය. සියලුම උපකාණ්ඩවල අපනයන ඉහළ යෑමත් සමඟ යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ අපනයන ආදායම ද ඉහළ ගිය අතර, සකස් කළ දුම්කොළ අපනයන ඉහළ යෑම හේතුවෙන් ආහාර, පාන වර්ග හා දුම්කොළ අපනයන ආදායම ඉහළ ගියේය. මීට අමතරව, 2019 ජනවාරි මාසයේදී කාර්මික අපනයන ඉහළ යෑම සඳහා සත්ත්ව ආහාර සහ මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත ද දායක විය. මේ අතර, විශේෂයෙන්ම, ඉන්දියාව සහ සිංගප්පූරුව වැනි කලාපයේ වරායන් වෙතින් ශ්‍රී ලංකාවේ වරායන් වෙත වූ ඉහළ තරගකාරිත්වය පිළිබිඹු කරමින් නැව් සඳහා භාවිතා කරන ඉන්ධන අපනයන පරිමාව සැලකිය යුතු ලෙස පහත වැටීම තුළින් නැව් සහ ගුවන්යානා ඉන්ධන අපනයන පහළ යෑම හේතුවෙන් 2019 ජනවාරි මාසයේදී ඛනිජතෙල් නිෂ්පාදිත අපනයන ආදායම අඛණ්ඩව දෙවැනි මාසයටත් සැලකිය යුතු ලෙස පහත වැටුණි. මීට අමතරව, 2019 ජනවාරි මාසයේදී මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ අපනයන ආදායම ද පහත වැටුණි.

- 2018 පෙබරවාරි මාසයට පසුව, ප්‍රථම වරට 2019 ජනවාරි මාසයේදී කෘෂිකාර්මික අපනයන ආදායම පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව වර්ධනය වූ අතර, පොල්, මුහුදු ආහාර, එළවළු හා සකස් නොකළ දුම්කොළ අපනයන වර්ධනය වීම ඒ සඳහා හේතු විය. දිසිදි පොල් මූලික කරගත් පොල් මද ආශ්‍රිත නිෂ්පාදිත සහ පොල් කෙඳි මූලික කරගත් පොල් මද ආශ්‍රිත නොවන නිෂ්පාදිත අපනයන ආදායම ඉහළ යෑම හේතුවෙන් පොල් අපනයන ආදායම ඉහළ ගියේය. යුරෝපා වෙළඳපොළ වෙත සිදු කළ අපනයන ඉහළ යෑම හේතුවෙන් මුහුදු ආහාර අපනයන ආදායම අඛණ්ඩව කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය. තේ අපනයන පරිමාව සැලකිය යුතු ලෙස ඉහළ ගියද, තේ සඳහා වූ සාමාන්‍ය අපනයන මිල ගණන් පහත වැටීම හේතුවෙන් 2019 ජනවාරි මාසයේදී තේ අපනයන ආදායම සුළු වශයෙන් පහත වැටුණි. මේ අතර, කුළුබඩු, සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත සහ රබර් අපනයන ආදායම පහත වැටුණි.
- ප්‍රධාන වශයෙන්ම, ලෝපස්, ලෝබොර හා අළු අපනයන වර්ධනය වීම හේතුවෙන් 2019 ජනවාරි මාසයේදී ඛනිජ ද්‍රව්‍ය අපනයන ආදායම ඉහළ ගියේය.
- 2019 ජනවාරි මාසයේදී අපනයන පරිමා දර්ශකය සියයට 13.7 කින් කැපී පෙනෙන ලෙස ඉහළ ගිය අතර, අපනයන මිල දර්ශකය සියයට 5.4 කින් පහත වැටුණි. 2018 ජනවාරි මාසයට සාපේක්ෂව අපනයන පරිමාව ඉහළ යෑම මෙම මාසයේදී අපනයන ආදායම වර්ධනය සඳහා මුළුමනින්ම හේතු වූ බව මෙයින් පිළිබිඹු වේ.

**රූප සටහන 3: මාසික අපනයන ක්‍රියාකාරිත්වය**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 4: මාසික අපනයන පරිමා දර්ශකය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

# සංඛ්‍යා සටහන 2: වෙළඳ භාණ්ඩ අපනයන ආදායම (අ)

| කාණ්ඩය | 2018 ජන-දෙසැ. (එ.ජ.ඩො. මිලියන) | වෙනස 2018/17 (%) | 2018 ජන. (එ.ජ.ඩො. මිලියන) | 2019 ජන. (එ.ජ.ඩො. මිලියන) | වෙනස 19 ජන./ 18 ජන. (%) | දායකත්වය (%) |
|---|---|---|---|---|---|---|
| **1. කාර්මික අපනයන** | **9,258.2** | **8.4** | **757.6** | **826.4** | **9.1** | **79.6** |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 462.3 | 17.7 | 48.2 | 53.1 | 10.2 | 5.1 |
| සත්ත්ව ආහාර | 107.8 | 34.5 | 7.1 | 16.8 | 137.2 | 1.6 |
| රෙදිපිළි හා ඇඟලුම් | 5,317.7 | 5.7 | 434.8 | 475.9 | 9.5 | 45.8 |
| එයින් ඇඟලුම් | 4,960.8 | 4.7 | 409.3 | 444.5 | 8.6 | 42.8 |
| රෙදිපිළි | 260.1 | 26.6 | 18.5 | 22.9 | 23.7 | 2.2 |
| වෙනත් රෙදිපිළි සැකසුම් | 96.8 | 10.9 | 7.0 | 8.4 | 21.0 | 0.8 |
| රබර් නිෂ්පාදිත | 875.3 | 4.8 | 71.0 | 80.7 | 13.5 | 7.8 |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 278.0 | 8.0 | 27.5 | 24.1 | (12.3) | 2.3 |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 434.8 | 17.3 | 29.7 | 36.8 | 23.9 | 3.5 |
| ප්‍රවාහන උපකරණ | 120.3 | (25.9) | 7.4 | 8.8 | 20.1 | 0.9 |
| ඛනිජ තෙල් නිෂ්පාදිත | 622.1 | 43.2 | 52.7 | 37.5 | (28.9) | 3.6 |
| රසායනික නිෂ්පාදිත | 166.8 | 13.9 | 12.5 | 14.9 | 18.6 | 1.4 |
| දැව හා කඩදාසි නිෂ්පාදිත | 140.5 | 1.2 | 11.3 | 12.1 | 6.8 | 1.2 |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 31.7 | (35.2) | 1.5 | 6.1 | 302.4 | 0.6 |
| සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 147.7 | (6.8) | 13.0 | 13.1 | 0.7 | 1.3 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 77.6 | 4.1 | 6.2 | 6.8 | 9.1 | 0.7 |
| මූල ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 165.4 | 42.8 | 12.1 | 14.1 | 16.4 | 1.4 |
| පිඟන් මැටි නිෂ්පාදිත | 31.3 | (7.3) | 2.0 | 2.4 | 23.7 | 0.2 |
| වෙනත් | 279.0 | 7.2 | 20.5 | 23.2 | 13.2 | 2.2 |
| **2. කෘෂිකාර්මික අපනයන** | **2,579.3** | **(6.8)** | **204.1** | **207.6** | **1.7** | **20.0** |
| තේ | 1,428.5 | (6.6) | 111.8 | 110.8 | (0.9) | 10.7 |
| රබර් | 31.6 | (18.8) | 4.1 | 2.8 | (31.1) | 0.3 |
| පොල් | 311.0 | (10.6) | 21.1 | 25.7 | 21.6 | 2.5 |
| කුළුබඩු | 360.2 | (11.3) | 30.0 | 27.8 | (7.3) | 2.7 |
| එළවළු | 28.2 | (0.8) | 1.9 | 2.7 | 39.3 | 0.3 |
| සකස් නොකළ දුම්කොළ | 35.6 | (2.5) | 1.8 | 2.1 | 21.0 | 0.2 |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 118.4 | (14.7) | 10.5 | 8.4 | (20.2) | 0.8 |
| මුහුදු ආහාර | 265.8 | 10.5 | 22.9 | 27.4 | 19.3 | 2.6 |
| **3. ඛනිජ අපනයන** | **34.4** | **(0.4)** | **1.4** | **2.4** | **66.2** | **0.2** |
| **4. වර්ග නොකළ අපනයන** | **17.8** | **5.8** | **2.2** | **1.7** | **(21.7)** | **0.2** |
| **මුළු අපනයන** | **11,889.6** | **4.7** | **965.4** | **1,038.1** | **7.5** | **100.0** |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්, ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික

## වෙළඳ භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය

- ශ්‍රී ලංකා මහ බැංකුව සහ රජය විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගවල බලපෑම පිළිබිඹු කරමින් 2019 ජනවාරි මාසයේදී වෙළඳ භාණ්ඩ ආනයන වියදම අඛණ්ඩව තෙවැනි මාසයටත් එ.ජ.ඩොලර් මිලියන 1,655 ක් දක්වා පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 17.8 කින් පහත වැටුණි. ආනයන යටතේ වර්ග කර ඇති සියලුම ප්‍රධාන කාණ්ඩ වන අන්තර් භාණ්ඩ, පාරිභෝගික භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ ආනයන පහත වැටීම මෙම අඩුවීම සඳහා දායක විය.
- සමස්ත ආනයන පහත වැටීම සඳහා අන්තර් භාණ්ඩ ආනයන විශාල වශයෙන් දායක වූ අතර, ඉන්ධන, රත්‍රන් සහ පොහොර ආනයන වියදම පහත වැටීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. ගල් අඟුරු ආනයන පරිමාව ඉහළ ගියද, බොරතෙල් හා පිරිපහදු කළ ඛනිජතෙල් සඳහා වූ සාමාන්‍ය ආනයන මිල ගණන් සහ එම ආනයන පරිමා අඩුවීම හේතුවෙන් ඉන්ධන ආනයන වියදම අඩු විය. රත්‍රන් ආනයන මත තීරු බද්දක් පැනවීමත් සමඟ 2018 මැයි මාසයේ සිට පහත වැටුණු රත්‍රන් ආනයන වියදම 2019 ජනවාරි මාසයේදී ද ඉතා කුඩා අගයක පැවතිණි. විශේෂයෙන්ම යූරියා ඇතුළු සියලුම උප කාණ්ඩවල ආනයන පරිමාව පහත වැටීම හේතුවෙන් පොහොර ආනයන වියදම ද කැපී පෙනෙන ලෙස පහත වැටුණි. මේ අතර, 2019 ජනවාරි මාසයේදී අන්තර් භාණ්ඩ ආනයන පහත වැටීම සඳහා තිරිඟු හා ඉරිඟු, මූල ලෝහ සහ රබර් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත ආනයන වියදම අඩු වීම සැලකිය යුතු ලෙස දායක විය. කෙසේ වුවද, මෙම මාසය තුළදී රෙදි වර්ග ආනයනය ඉහළ යෑම හේතුවෙන් රෙදිපිළි හා රෙදිපිළි උපාංග ආනයන වියදම ඉහළ ගිය අතර ඛනිජ ද්‍රව්‍ය හා කෘෂිකාර්මික යෙදවුම් ආනයන ද ඉහළ ගියේය.
- ප්‍රධාන වශයෙන් පාන වර්ග හා කුළුබඩු ආනයන හැර අනෙකුත් උප කාණ්ඩ සියල්ලකම පාහේ ආනයන වියදම පහත වැටීම හේතුවෙන් පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පහත වැටුණි. ආනයන අඩුකිරීම සඳහා ගන්නා ලද ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගවල බලපෑම පිළිබිඹු කරමින් 2018 නොවැම්බර් මාසයේ සිට දක්නට ලැබුණු පහළ යෑමේ ප්‍රවණතාව අඛණ්ඩව පවත්වා ගනිමින් පෞද්ගලික මෝටර් රථ ආනයන වියදම කැපී පෙනෙන ලෙස පහත වැටුණි. 2019 ජනවාරි මාසයේදී ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ සියල්ලකම පාහේ ආනයන වියදම පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව පහත වැටුණි. කෙසේ වුවද, 2019 වසර සඳහා වූ අයවැය මගින් නිෂ්පාදන බදු සංශෝධන කිරීම, විනිමය අනුපාතිකය මත ඇති වූ පීඩනය අඩුවීම සහ විදේශීය අංශයේ අනෙකුත් වර්ධනයන් සලකා බලමින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රථවාහන සහ අත්‍යවශ්‍ය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයනය සඳහා ණයවර ලිපි විවෘත කිරීමේදී පනවා තිබූ ආන්තික තැන්පතු අවශ්‍යතාව 2019 මාර්තු 07 දින සිට බලපැවැත්වෙන පරිදි ඉවත් කරන ලද අතර ප්‍රතිග්‍රහණය මත ලියවිලි ලබා දීමේ කොන්දේසි මත ආනයනය කිරීමේදී පනවා තිබූ මුදල් තැන්පතු අවශ්‍යතාව 2019 මාර්තු 12 දින සිට බලපැවැත්වෙන පරිදි ඉවත් කරන ලදී. මේ අතර, දේශීය වෙළඳපොළෙහි සහල් සැපයුම ඉහළ යෑම හේතුවෙන් 2019 ජනවාරි

මාසයේදී ද සහල් ආනයන වියදම අඩුවීමේ ප්‍රවණතාව අඛණ්ඩව පැවතුණි. එළවළු සහ කිරි නිෂ්පාදිත ආනයන වියදම ද පහත වැටුණි.

- ආයෝජන භාණ්ඩ යටතේ වර්ග කර ඇති සියලුම උප කාණ්ඩවල ආනයන අඩුවීම හේතුවෙන් 2019 ජනවාරි මාසයේදී ආයෝජන භාණ්ඩ ආනයන වියදම ද පහත වැටුණි. මෙම අඩුවීම සඳහා ප්‍රවාහන උපකරණ යටතේ වර්ග කර ඇති වාණිජ කටයුතු සඳහා යොදා ගනු ලබන කැබ්රථ හා ත්‍රීරෝද රථ සහ ගොඩනැගිලි ද්‍රව්‍ය යටතේ වර්ග කර ඇති යකඩ හා වානේ ආනයනය අඩුවීම හේතු විය.
- 2019 ජනවාරි මාසයේදී ආනයන පරිමා දර්ශකය හා ආනයන මිල දර්ශකය පිළිවෙළින් සියයට 14.6 කින් හා සියයට 3.7 කින් පහත වැටුණු අතර, එමගින් 2018 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව ආනයන පහත වැටීම සඳහා ආනයන පරිමාව මෙන්ම ආනයන මිල ගණන් පහළ යෑම හේතු වූ බව පිළිබිඹු වේ.

**රූප සටහන 5: මාසික ආනයන ක්‍රියාකාරිත්වය**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 6: මාසික ආනයන පරිමා දර්ශකය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 7: පෞද්ගලික භාවිතය සඳහා වන රථවාහන ආනයන වියදම - 2018/19**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

# සංඛ්‍යා සටහන 3: වෙළඳ භාණ්ඩ ආනයන වියදම (අ)

| කාණ්ඩය | 2018 ජන-දෙසැ. (එ.ජ.ඩො. මිලියන) | වෙනස 2018/17 (%) | 2018 ජන. (එ.ජ.ඩො. මිලියන) | 2019 ජන. (එ.ජ.ඩො. මිලියන) | වෙනස ජන.19/ජන.18 (%) | දායකත්වය (%) |
|---|---|---|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | **4,979.7** | **10.6** | **441.5** | **300.5** | **(31.9)** | **18.2** |
| ආහාර හා පාන වර්ග | 1,606.1 | (12.8) | 183.7 | 111.2 | (39.5) | 6.7 |
| ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 126.2 | (59.9) | 33.2 | 4.0 | (88.1) | 0.2 |
| එයින් සහල් | 106.8 | (64.5) | 31.3 | 2.3 | (92.5) | 0.1 |
| කිරි නිෂ්පාදිත | 332.3 | 5.2 | 31.9 | 17.9 | (44.0) | 1.1 |
| එළවළු | 304.0 | (17.4) | 39.8 | 24.6 | (38.2) | 1.5 |
| මුහුදු ආහාර | 197.2 | (9.3) | 20.6 | 18.4 | (10.6) | 1.1 |
| සීනි හා රසකැවිලි | 249.7 | (3.2) | 27.6 | 14.9 | (45.9) | 0.9 |
| කුළුබඩු | 114.0 | 22.9 | 7.5 | 8.8 | 16.3 | 0.5 |
| වෙනත් ආහාර හා පාන වර්ග | 282.7 | 3.0 | 23.0 | 22.6 | (1.6) | 1.4 |
| ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 3,373.6 | 26.8 | 257.8 | 189.3 | (26.5) | 11.4 |
| පෞද්ගලික රථවාහන | 1,573.5 | 103.6 | 95.0 | 49.5 | (47.9) | 3.0 |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 532.0 | 2.3 | 44.1 | 41.3 | (6.4) | 2.5 |
| ගෘහ උපකරණ | 232.2 | (10.1) | 18.9 | 14.3 | (24.4) | 0.9 |
| රෙදිපිළි හා උපාංග | 310.3 | (15.9) | 37.5 | 28.4 | (24.4) | 1.7 |
| විදුලි සංදේශ මෙවලම් | 272.4 | (3.1) | 24.4 | 20.4 | (16.4) | 1.2 |
| ගෘහ හා දැව භාණ්ඩ | 169.4 | (9.0) | 15.8 | 13.4 | (15.4) | 0.8 |
| වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 283.8 | 3.5 | 22.0 | 22.1 | 0.3 | 1.3 |
| **2. අන්තර් භාණ්ඩ** | **12,488.0** | **9.2** | **1,133.3** | **956.1** | **(15.6)** | **57.8** |
| ඉන්ධන | 4,151.9 | 21.1 | 362.0 | 329.0 | (9.1) | 19.9 |
| එයින් බොරතෙල් | 978.1 | 38.9 | 103.4 | 87.8 | (15.1) | 5.3 |
| පිරිපහදු කළ ඛනිජ තෙල් | 2,937.2 | 19.3 | 223.9 | 186.0 | (16.9) | 11.2 |
| ගල් අඟුරු | 236.6 | (9.5) | 34.7 | 55.2 | 59.0 | 3.3 |
| දියමන්ති, අගනා ගල් හා ලෝහ වර්ග | 572.7 | (25.9) | 104.7 | 16.6 | (84.2) | 1.0 |
| එයින් රත්‍රන් | 438.7 | (32.5) | 93.7 | 0.1 | (99.9) | … |
| රෙදිපිළි හා රෙදිපිළිඋපාංග | 2,858.5 | 4.9 | 245.2 | 262.5 | 7.0 | 15.9 |
| කඩදාසි හා සන කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 529.4 | 9.3 | 43.1 | 38.6 | (10.6) | 2.3 |
| කෘෂිකාර්මික යෙදවුම් | 207.6 | 1.6 | 12.9 | 15.3 | 18.2 | 0.9 |
| තිරිඟු හා ඉරිඟු | 373.5 | 4.7 | 31.0 | 14.5 | (53.3) | 0.9 |
| මූල ලෝහ | 682.8 | 8.6 | 59.6 | 46.7 | (21.6) | 2.8 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 697.4 | 10.2 | 54.7 | 53.0 | (3.3) | 3.2 |
| රසායනික නිෂ්පාදිත | 904.2 | 8.4 | 74.4 | 76.1 | 2.3 | 4.6 |
| පොහොර | 261.6 | 154.4 | 42.4 | 3.7 | (91.2) | 0.2 |
| රබර් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 268.9 | (6.6) | 26.5 | 19.7 | (25.7) | 1.2 |
| වෙනත් අන්තර් භාණ්ඩ | 979.5 | ... | 76.6 | 80.6 | 5.1 | 4.9 |
| **3. ආයෝජන භාණ්ඩ** | **4,690.4** | **(4.2)** | **436.9** | **398.5** | **(8.8)** | **24.1** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 2,491.6 | (4.9) | 240.3 | 231.2 | (3.8) | 14.0 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 1,524.5 | (4.2) | 143.1 | 132.0 | (7.8) | 8.0 |
| ප්‍රවාහන උපකරණ | 668.1 | (1.0) | 52.7 | 34.8 | (34.0) | 2.1 |
| වෙනත් ආයෝජන භාණ්ඩ | 6.1 | (22.4) | 0.7 | 0.5 | (23.6) | … |
| **4. වර්ග නොකළ ආනයන** | **74.6** | **(49.1)** | **2.9** | **0.3** | **(88.6)** | **…** |
| **මුළු ආනයන** | **22,232.7** | **6.0** | **2,014.5** | **1,655.5** | **(17.8)** | **100.0** |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා අයි.ඕ.සී. සමාගම, ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික

## ජංගම ගිණුම වෙත වාර්තා වූ අනෙකුත් ප්‍රධාන ලැබීම්

- 2019 ජනවාරි මාසයේදී සංචාරක පැමිණීම සියයට 2.2 ක වර්ධනයක් වාර්තා කරමින් 2018 ජනවාරි මාසයේදී වූ 238,924 ක මුළු සංචාරක පැමිණීම්වලට සාපේක්ෂව 2019 වසරේ ජනවාරි මාසයේදී මුළු පැමිණීම් 244,239 ක් විය.
- 2019 වසරේ ජනවාරි මාසයේදී සංචාරක පැමිණීම් අතරින් ඉන්දියාව ප්‍රමුඛස්ථානයේ තවදුරටත් පැවති අතර, චීනය, එක්සත් රාජධානිය, ජර්මනිය සහ රුසියාව පිළිවෙළින් ඉහළ ස්ථානවල පැවතුණි.
- සංචාරක පැමිණීම්හි වර්ධනය වීමත් සමඟ 2018 ජනවාරි මාසයේදී වාර්තා වූ සංචාරක ඉපැයීම් එ.ජ. ඩොලර් මිලියන 448 ට සාපේක්ෂව 2019 ජනවාරි මාසයේදී සංචාරක ඉපැයීම් එ.ජ. ඩොලර් මිලියන 458 ක් දක්වා වර්ධනය විය.
- 2019 ජනවාරි මාසයේදී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 545 ක් දක්වා සියයට 25.2 කින් සැලකිය යුතු ලෙස පහළ ගියේය.

**රූප සටහන 8 : සංචාරක පැමිණීම්හි ප්‍රධාන රටවල් (ජනවාරි)**




මූලය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

**රූප සටහන 9 : සංචාරක ඉපැයීම් සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ**




මූලයන්: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
බලපත්‍රලාභී වාණිජ බැංකු
ශ්‍රී ලංකා මහ බැංකුව

## මූල්‍ය ලැබීම්

- 2019 ජනවාරි මාසයේදී රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ සහ කොළඹ කොටස් වෙළඳපොළ වෙතින් විදේශීය ආයෝජන ශුද්ධ ගෙවීම් අඩුවීමක් වාර්තා විය. මෙම මාසය තුළ රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් එ.ජ. ඩොලර් මිලියන 29 ක ශුද්ධ ගෙවීමක් වාර්තා විය. එය 2018 දෙසැම්බර් මාසයේදී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 188 ක ශුද්ධ ගෙවීම සමඟ සැසඳීමේදී සැලකිය යුතු අඩුවීමකි. ප්‍රාථමික සහ ද්විතියික වෙළඳපොළ ගනුදෙනු අන්තර්ගත කොළඹ කොටස් වෙළඳපොළෙහි විදේශීය ආයෝජන 2018 වසරේ දෙසැම්බර් මාසයේදී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 26 ක ශුද්ධ ගෙවීම සමඟ සැසඳීමේදී 2019

ජනවාරි මාසයේදී එ.ජ. ඩොලර් මිලියන 14 ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය.

- 2019 ජනවාරි මාසයේදී රජය වෙත වූ දිගුකාලීන ණය, එ.ජ. ඩොලර් මිලියන 78 ක ශුද්ධ ලැබීමක් වාර්තා කළේය. දේශපාලනික අස්ථාවරත්වය අවසාන වීමත් සමඟ ප්‍රධාන යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා ණය ලැබීම් නැවත ආරම්භ වීම හේතුවෙන් 2019 ජනවාරි මාසයේදී රජයේ ණය ලැබීම් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.

## ජාත්‍යන්තර සංචිත

- 2019 ජනවාරි මස අවසානය වන විට දළ නිල සංචිත ප්‍රමාණය එ.ජ.ඩොලර් බිලියන 6.2 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, එය ආනයනික මාස 3.4 කට සමාන විය. දළ නිල සංචිත සහ බැංකු අංශයේ විදේශීය වත්කම්වලින් සමන්විත මුළු විදේශීය වත්කම් ප්‍රමාණය 2019 ජනවාරි අවසානය වන විට ආනයනික මාස 4.8 කට සමාන වන පරිදි එ.ජ. ඩොලර් බිලියන 8.7 ක් විය. ඉන් අනතුරුව, 2019 මාර්තු මස අවසානය වන විට ජාත්‍යන්තර ස්වෛරීත්ව නිකුත් කිරීමෙන් වූ එ.ජ. ඩොලර් බිලියන 2.4 ක ලැබීම් සමඟ, දළ නිල සංචිත එ.ජ.ඩොලර් බිලියන 7.6 ක් දක්වා ඉහළ ගිය අතර, එය ආනයනික මාස 4.3 කට සමාන විය.

**රූප සටහන 10 : දළ නිල සංචිත සහ ගෙවුම් තුලනයේ සමස්ත ශේෂය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## විනිමය අනුපාතිකයේ හැසිරීම

- 2019 වසරේ අප්‍රේල් 17 වැනි දින දක්වා කාලපරිච්ඡේදය තුළදී ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 4.6 කින් අතිප්‍රමාණය විය. අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම පිළිබිඹු කරමින් මෙම කාලපරිච්ඡේදය තුළදී ශ්‍රී ලංකා රුපියල අනෙකුත් සියලු ප්‍රධාන ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව අතිප්‍රමාණය විය.

**රූප සටහන 11 :**

**එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියලෙහි අගය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 4 :**

**තෝරාගත් ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි වෙනස්වීම**

| මුදල් ඒකකය | 2018 | 2019 (අප්‍රේල් 17 දක්වා) අවප්‍රමාණය (-)/ අතිප්‍රමාණය (+) |
|---|---|---|
| එ.ජ. ඩොලරය | -16.4% | +4.6% |
| යුරෝ | -12.7% | +5.9% |
| ස්ටර්ලින් පවුම | -11.4% | +1.7% |
| ජපන් යෙන් | -18.1% | +6.1% |
| කැනේඩියානු ඩොලරය | -9.3% | +2.5% |
| ඕස්ට්‍රේලියානු ඩොලරය | -7.6% | +2.6% |
| ඉන්දියානු රුපියල | -8.7% | +4.0% |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව